# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 3 ශ්‍රේණිය / තෙවන වාරය - සැප්තැම්බර් මාසය - තෙවන සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

ටී.ඩබ්.නිපුන් කාවින්ද ලීලාරත්න - ර/පුස්සැල්ල මහා විද්‍යාලය

## 27 ඒකකය - දිග මැනීම 2

❖ **දිග මැනීමේ සම්මත ඒකකය මීටර වේ. මීටරය සඳහා වන සම්මත සංකේතය m වේ.**

01. ආදරණීය දුවේ පුතේ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමට මීටර කෝදුවක් හෝ මීටරයක් දිගැති කෝටුවක් සපයා ගන්න.

- පළමු ව ඔබේ නිවසේ ඇති ස්ථානවල හෝ ද්‍රව්‍ය කිහිපයක දිග ඔබට හැඟෙන ආකාරයට කොපමණ දිග වේ දැයි සිතා ගන්න. (උදාහරණ :- නිදන කාමරයේ දිග මා සිතන ආකාරයට මීටර 3යි)
- ඉන් පසු මීටරයේ කෝදුවෙන් හෝ මීටරයක් දිගැති කෝටුවෙන් මනින්න. එවිට සැබෑ දිග ඔබට ලැබේවි.
- ඉන් පසු පහත ආකාරයට එම මිනුම් වගුවක ඇතුළත් කරන්න.

| මනිනු ලබන දෙය | සිතූ දිග (ආසන්න මීටරයට) | සැබෑ දිග (ආසන්න මීටරයට) |
|---|---|---|
| කාමරයේ දිග | 3m | 4m |
| නිවසේ සිට අඹ ගසට ඇති දුර | 5m | 7m |
| | | |
| | | |
| | | |
| | | |

02. සම්මත සංකේතය යොදා ලියන්න.

i. මීටර 8යි - ................

i. මීටර 11යි - ................

i. මීටර 16යි - ................

iv. මීටර 19යි - ................

03. පහත වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| මනිනු ලැබූ දෙය | සිතූ දිග (ආසන්න මීටරයට) | සැබෑ දිග (ආසන්න මීටරයට) |
|---|---|---|
| පොල් ගසේ සිට නිවසට ඇති දුර | 3m | 4m |
| නිවසේ සිට ළිඳට ඇති දුර | 5m | 7m |
| දොරේ උස | 2m | 2m |
| ජනේලයේ පළල | 3m | 2m |

(1) සැබෑ දිග සිතූ දිගට සමාන වී ඇත්තේ ................................................... මැනීමේ දී ය.

(2) සැබෑ දිග සිතූ දිගට වඩා මීටර 1ක් වැඩියෙන් ලැබී ඇත්තේ ............................................. මැනීමේ දී ය.

(3) සැබෑ දිග සිතූ දිගට වඩා මීටර 1ක් අඩුවෙන් ලැබී ඇත්තේ ........................................... මැනීමේ දී ය.

(4) කොඩි කණුවේ උසෙහි සැබෑ දිග සිතූ දිගට වඩා ..................................................... අඩු වේ.

(5) සැබෑ දිග සිතූ දිගට වඩා මීටර 2ක් වැඩියෙන් ලැබී ඇත්තේ ............................................. මැනීමේ දී ය.

(6) නිවසේ සිට ළිඳට ඇති සැබෑ දුර කොපමණ ද? ..............................................

04. ගණිතය වැඩපොතේ පිටු අංක 44, 45, 46, 47 පිටුවල ඇති අභ්‍යාස සිදු කරන්න.